# ලංසු කැඳවීම

## (ශ්‍රී ලංකා රජයේ අරමුදල් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති)

## මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

## කොළඹ 02 පිහිටි ලෝහෝර් ආර්යා ණය අරමුදල් කාර්යාල ගොඩනැඟිල්ලේ පළමු මහලේ නානකාමර ජල කාන්දුවීම් පිළිසකර කිරීම

## කොන්ත්‍රාත් අංකය: LLLF/Buld. Maint – 2022

පාලන භාරකරු, ලෝහෝර් ආර්යා ණය අරමුදල, තැ.පෙ.1189, 100 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ - 02 වෙනුවෙන් ලෝහෝර් ආර්යා ණය අරමුදලේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, පහත සඳහන් පරිදි **"කොළඹ 02 පිහිටි ලෝහෝර් ආර්යා ණය අරමුදල් කාර්යාල ගොඩනැඟිල්ලේ පළමු මහලේ නානකාමර ජල කාන්දුවීම් පිළිසකර කිරීම", කොන්ත්‍රාත් අංකය LLLF/A/Buld. Maint - 2022** සඳහා යෝග්‍යතා පූර්ණ, සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ, එහි පිරිවැය බදු රහිතව රු. මිලියන 3.37 ක් (ආසන්න වශයෙන්) ලෙස ඇස්තමේන්තුගත කර ඇත. කොන්ත්‍රාත් කාලය ආරම්භක දිනයේ සිට ලිත් දින 100 කි.

**ප්‍රමාණ බිල්පත (BOQ) සහ නිරූපිතයන්හි විස්තර කර ඇති පරිදි මෙම කාර්යය කොන්ක්‍රීට් වැඩ, ජලනල වැඩ, ව්‍යුහාත්මක අළුත්වැඩියා කටයුතු, ජල ආරක්ෂණ කටයුතු, පිඟන් ගඩොල් ඇතිරීම, සනීපාරක්ෂක උපාංග සහ සවි කිරීම් කටයුතු, ඇලුමිනියම් වැඩ, තීන්ත ආලේපන කටයුතු යනාදිය ඇතුළුව නාන කාමරය ප්‍රතිසංස්කරණය කිරීමේ කාර්යයන්ගෙන් සමන්විත වේ.**

1. මෙම ලංසුකරණය ජාතික තරඟකාරී ලංසුකරණ (NCB) පටිපාටිය යටතේ සිදු කරනු ලැබේ. මෙම ප්‍රසම්පාදනයේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 50 ට වඩා පහළ අගයක් ගන්නා බැවින්, රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක. 04/2016 (ii) හි දක්වා ඇති පරිදි කලාපීය මනාපය සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ශ්‍රේණි මනාපය අදාළ වනු ඇත.

2. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා, සුදුසුකම් ලබන ලංසුකරු අසාදු ලේඛනගත කර නොතිබිය යුතු අතර පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතුය.

   ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි වී තිබීම අවශ්‍ය වේ:

   විශේෂඥතාව: ගොඩනැඟිලි

   ශ්‍රේණිය: ලංසු කැඳවීම අවසන් වන දිනය දක්වා **C8** සහ **C7** වලංගුභාවය පැවතීම. තවද, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන දිනයේදී, වලංගු ලියාපදිංචියක් සතුවිය යුතුය.

3. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය යෝග්‍යතා නිර්ණායක:

   පසුගිය වසර 5 තුළ අවම වශයෙන් යෝජිත කාර්යයට සමාන ස්වභාවයකින් සහ සංකීර්ණත්වයකින් යුතු ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු එකක හෝ නියැලී ලබා ගත් පළපුරුද්ද. (මෙම අවශ්‍යතාවයට අනුකූල වීම සඳහා, සඳහන් කරන ලද කාර්යයෙන් අවම වශයෙන් සියයට 70ක ප්‍රතිශතයක් සම්පූර්ණ කර තිබිය යුතු වේ.)

4. අභිලාෂී ලංසුකරුවන්ට මේ පිලිබඳ වැඩිදුර තොරතුරු, 2024.05.08 වන දින සිට 2024.05.28 වන දින දක්වා සතියේ දිනයන්හි පැය 0900 සිට පැය 1500 දක්වා සාමාන්‍ය කාර්යාලයීය වේලාවන්හිදී **ලෝහෝර් ආර්යා ණය අරමුදලේ ප්‍රසම්පාදන ඒකකය, තැ.පෙ. 1189, 100 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ - 02, දුරකථන:** 0112431012, 0112449175, 0112324044, 0112338315, **විද්‍යුත් තැපැල :** lady.lochore@gmail.com මඟින් සහ එම ලිපිනයෙහි වෙබ් අඩවිය පරීක්ෂා කිරීමෙන් ලබා ගතහැකි වේ.

5. අභිලාෂී ලංසුකරුවන්හට ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද අංග සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ලෝහෝර් ආර්යා ණය අරමුදල, තැ.පෙ. 1189, 100 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ - 02 වෙත** 2024.05.08 වන දින සිට 2024.05.28 වන **දින දක්වා පැය 0900 සිට පැය 1500 දක්වා** ලිඛිත අයදුම්පතක් සහ ආපසු නොගෙවන **රු. 2500.00 ක** ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව ලබා ගත හැකි වේ. ගෙවීම් කටයුතු මුදල් මඟින් සිදු කළ යුතුය.

6. පහත 9 හි සඳහන් ලේඛන ඇතුලත්ව යථා පරිදි සම්පූර්ණ කරන ලද ලංසු, "මුල් පිටපත" (Original) සහ "අනුපිටපත" (Duplicate) ලෙස පිටපත් දෙකකින් යුතුව වෙන වෙනම කරවවල බහා පසුව එම කවර එක් කවරයක් බහා මුද්‍රා තබා, **ලෝහෝර් ආර්යා ණය අරමුදල, තැ.පෙ. 1189, 100 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ - 02 කාර්යාල ලිපිනයෙහි** තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම හෝ **2024.05.28** වන දින **ප.ව. 2.00** ට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට කටයුතු කළ හැකිය. ප්‍රධාන කවරය මුද්‍රා තැබිය යුතු අතර, ප්‍රධාන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ලංසු නාමය සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම, ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරිපිටදී ලංසු විවෘත කරනු ලැබේ.

7. ඉදිරිපත් කරන ලද ලංසු දින 91 ක වලංගු කාලයකින් යුතු විය යුතුය.

8. සියලුම ලංසු සමඟ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් නිකුත් කළ රු. 55,000.00 ක ලංසු සුරක්ෂණයක් හෝ ඉදිකිරීම් ඇපකරයක්, පාලන භාරකරු, ලෝහෝර් ආර්යා ණය අරමුදල, තැ.පෙ. 1189, 100 3/ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ - 02 යන ලිපිනය වෙත එවිය යුතු අතර, එය **2024.09.23** වන දින දක්වා (ලන්සු භාර ගැනීම අවසන් වන දින සිට දින 119 ක කාලසීමාවක්) දක්වා වලංගු විය යුතුය.

9. මිල ගණන් ඉදිරිපත් කරන සියලුම ටෙන්ඩර් පත්‍රිකා සඳහා, ලංසු සමඟින් පහත තොරතුරු සහ අදාළ ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය;

   - සුදුසුකම් ලබන ලංසුකරුවන් අසාදු ලේඛනගත වූවන් නොවිය යුතුය.
   - මූල්‍ය ස්ථායිතාවයට අදාළ ලේඛනය සහ බැංකු ණය පහසුකම් පිළිබඳ තොරතුරු (බැංකුවෙන් ලබාගත් සහතික කිරීමේ ලිපි සමඟ).
   - ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි ශ්‍රේණිය සනාථ කිරීමට අදාළ වන ලේඛන
   - ලංසු ලේඛනය මඟින් ඉල්ලා ඇති අනෙකුත් විස්තර.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
ලෝහෝර් ආර්යා ණය අරමුදල,
තැ.පෙ. 1189, 100 3/2,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ-02